**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2013**

**-----------------------------------------------------**

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීයෙකුට ගෙවා තිබුණු රු. මිලියන 30 ක ත්‍යාග අත්තිකාරම් මුදලින් රු.මිලියන 27.75 ක් නිලධාරීන්ට ගෙවූ ත්‍යාග මුදල් ගිණුමට ද රු.මිලියන 2.25 ක් "උපයන විට ගෙවීම් බදු සඳහා බදු ගිණුමට" ද හර විය යුතු වුවත් රු. මිලියන 30 ම "ඔත්තුකරුවන්ට ගෙවූ ත්‍යාග මුදල් ගිණුමට" හර කර තිබුණි.

(ආ) එකතුව රු. 64,157,056 ක් වූ රඳවා ගැනීමේ බදු හා උපයන විට ගෙවීම් බදු වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 30,154,929 ක් වූ ආපසු තැන්පත් ත්‍යාග අරමුදල් ගිණුමේ ශේෂය වර්ෂ ගණනාවක සිට සමුච්චිත වෙමින් ඉදිරියට එන ශේෂයක් ලෙස නිරීක්ෂණය වූ අතර දීර්ඝ කාලීන නොපියවුම් සඳහා විධිමත් පියවරක් ගෙන නොතිබුණි. එසේම කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සුළු වටිනාකම්වලින් යුත් රු.1,250 සිට රු.12,500 ක් දක්වා වන ත්‍යාග මුදල් නොගෙවා තිබීම මත 2013 දෙසැම්බර් 31 දිනට ත්‍යාග අරමුදලේ රු.313,450 ක ශේෂයක් පැවතුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 116 හා 114 වගන්තිය | (i) සමාලෝචිත වර්ෂයේදී ත්‍යාග ගෙවීම් සිදුකල නිලධාරීන් 109 දෙනෙකුගෙන් එකතුව රු.25,691,862 ක් හා ඉකුත් වර්ෂයේදී නිලධාරීන් 234 දෙනෙකුගෙන් එකතුව රු.4,823,846 ක් වූ උපයන විට ගෙවීම් බදු අඩුවෙන් අයකර තිබුණි. |

(ii) නිලධාරීන්ට ගෙවන ත්‍යාග මුදල් සඳහා උපයන විට ගෙවීම් බදු අඩු කිරීමේදී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් පරිදි දීමනා සමුච්චිත කර ගණනය කර නොතිබීමෙන් විශාල බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.115,741,700 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,599,048 ක් විය. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ලෙස රු.68,142,652 කින් එනම් සියයට 143 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහ ඉකුත් වර්ෂ හයකට අදාළව අරමුදලේ ආදායම්, වියදම් හා ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු පහත දක්වා ඇත.

| වර්ෂය | ආදායම | වියදම - නිලධාරීන්ට ගෙවීම් | වියදම - ඔත්තුකරුවන්ට ගෙවීම් | වියදම - බදු, දේශීය ආදායම් දෙපා: | වියදම - අනෙකුත් වියදම් | මුළු වියදම | අතිරික්තය / (ඌනතාවය) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2007 | 1,171,679,881 | 810,441,327 | 72,757,307 | 105,428,768 | 111,382,303 | 1,100,009,705 | 71,670,176 |
| 2008 | 895,773,758 | 678,463,260 | 55,144,035 | 8,693,891 | 119,792,064 | 862,093,250 | 33,680,508 |
| 2009 | 968,064,233 | 716,618,818 | 84,506,905 | 9,132,859 | 113,226,650 | 923,485,232 | 44,579,001 |
| 2010 | 902,474,770 | 687,504,664 | 37,556,075 | 9,328,789 | 102,357,464 | 836,746,992 | 65,727,779 |
| 2011 | 873,979,003 | 574,047,509 | 106,080,370 | 33,927,845 | 102,229,782 | 816,285,506 | 57,693,497 |
| 2012 | 973,210,594 | 694,361,096 | 128,208,276 | 42,779,776 | 60,262,398 | 925,611,546 | 47,599,048 |
| 2013 | 1,522,699,798 | 1,146,769,044 | 121,281,124 | 64,157,056 | 74,750,874 | 1,406,958,098 | 115,741,700 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රේගු නිළධාරීන්ගේ ත්‍යාග අරමුදලට ලැබී ඇති ආදායම රු. 549,489,204 කින් වැඩි වී තිබුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 56 ක් විය.

(ආ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ නිලධාරීන්ට ත්‍යාග ගෙවීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.452,407,948 ක් හෙවත් සියයට 65 ක වැඩිවීමක් විය.

(ඇ) රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති දෙපාර්තමේන්තු නියෝග අංක 118 හා එහි (අ) සිට (ග) දක්වා වූ සංශෝධන මඟින් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර ත්‍යාග මුදල් බෙදා හැරීමේ යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබූ අතර, 2011,2012 හා 2013 වර්ෂවල දී පිළිවෙලින් රු. මිලියන 680 ක් 822 ක් හා 1268 ක් වශයෙන් එකතුව රු. මිලියන 2,770 ක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණි. මින් රු. මිලියන 2,415 ක් හෙවත් සියයට 87 ක් නිලධාරීන් වෙත ගෙවා ඇති ත්‍යාග මුදල් වූ අතර, ලබා දිය හැකි ත්‍යාග මුදල් පිළිබඳ උපරිම සීමා පනවා නොමැති බව ද නිරීක්ෂණය විය. ඒ අනුව එක් නිලධාරියෙකු සඳහා එක් වරකදී රු. මිලියන 90 ඉක්මවා ත්‍යාග ලෙස ගෙවූ අවස්ථාද තිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 වර්ෂයේ සිට 2003 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළ ආනයනයන් 12 කට අදාළව භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංකය සාවද්‍ය ලෙස දැක්වීම යන වරද යටතේ ව්‍යවස්ථාපිත සංස්ථාවක් වෙත පනවා තිබූ රු.208,283,881 ක දණ්ඩනය 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවීම්කර තිබුණි. එම දණ්ඩන මුදලින් සියයට 30 ක් හෙවත් රු.62,485,164 ක් පමණක් රාජ්‍ය ආදායමට බැරකර තිබූ අතර ඉතිරි සියයට 70 ක මුදල හෙවත් රු.145,798,717 ක් රේගු නිලධාරීන් හා එම නිලධාරීන්ගේ සුභසාධනය සඳහා පවත්නා අරමුදල වෙත වෙන්කර තිබුණි.

1870 ජනවාරි 01 දිනැති 1869 අංක 17 දරන, රේගු ආඥා පනත හා සංශෝධිත 235 වැනි අධිකාරියෙහි 163 හා 164 වගන්ති පරිදි පනවන ලද දණ්ඩන සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර මෙම දණ්ඩනය ඉවත් කර ගැනීමට හෝ ලිහිල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්නෙට් ව්‍යාපෘතිය යටතේ බදු ගෙවීමකින් තොරව තාවකාලික අපනයන පදනම මත ආනයනය කරනු ලබන වාහන, ප්‍රතිඅපනයනය නොකර ලංකාවේ ලියාපදිංචි කිරීම සඳහා හිමිකරුවන් විසින් ඉල්ලීම් සිදු කර ඇති අවස්ථාත්, රේගු නිලධාරීන් විසින් එම අවස්ථා රේගු විමර්ශනයක් ලෙස සලකා වාහන වල අයිතිය ආනයනය කළ පාර්ශවයන්ටම පැවරීම සිදු කර ඇත. එහිදී වාහනයට නියමිත බදු වටිනාකම පදනම්ව අයකරන ලද දණ්ඩන වටිනාකමින්ද සියයට 70 ක් නිලධාරීන්ගේ ත්‍යාග ගෙවීම් හා ඔවුන්ගේ සුභසාධන අරමුදල් වෙත වෙන් කිරීම් කර තිබුණි.

(ඇ) රේගු දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ ඉන්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.26,954,018 ක ප්‍රතිපාදන ලැබී තිබියදී නිශ්චිත නිර්ණායක හඳුනා ගැනීමකින් තොරව ත්‍යාග අරමුදලින් රු.41,455,915 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන අරමුදල සඳහා වෙන්කර තිබූ අතර, විධිමත් අනුමැතියකින් තොරව එයින් රු.3,848,787 ක ඉන්ධන වියදමක් දරා තිබුණි.

(ඈ) නිශ්චිත නිර්ණායක හඳුනාගැනීමකින් තොරව ත්‍යාග අරමුදලින් රු. 14,802,153 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී විෂ මත්ද්‍රව්‍ය අරමුදල සඳහා වෙන් කර එයින් රු.3,200,000 ක වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණ අතර, මෙම වියදම් කුමක් සඳහා යොදා ගන්නේද යන්න පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එය පසුගිය වර්ෂයේ වියදමට සාපේක්ෂව රු.1,405,000 කින් හෙවත් සියයට 78 කින් වැඩිවී තිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-----------------------------------------**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අනුමත කර ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සඳහා 2013 ජුනි 21 දින මාස 09 ක කාල ප්‍රමාදයකින් පසුව අනුමැතිය ලැබී තිබුණි.

(ආ) වියදම් අයිතම 7 ක් සම්බන්ධව අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 32 සිට සියයට 1,222 දක්වා විචලනයන් පැවතුනු අතර ආදායම් අයිතම 3 ක් සම්බන්ධයෙන් අයවැය ගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 64 සිට සියයට 178 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ලෙජර් ගිණුම්
(ආ) ත්‍යාග අරමුදලට අදාළ උප අරමුදල්
(ඇ) ත්‍යාග මුදල් බෙදා දීම
(ඈ) ත්‍යාග අරමුදලේ වියදම්